රාහුල විද්‍යාලයීය වාෂිකී‍ක ත්‍යාග ප්‍රදානොත්සවය - 2025

දක්ෂතම ශිෂ්‍යයා තේරීම

මූලික සුදුසුකම්

මාර/රාහුල විද්‍යාලයේ අ.පොෂ.ස.(සා.පෙළ)විභාගය සමත්ව රාහුල විද්‍යාලයෙන්ම අ.පොෂ.ස.(උ.පෙළ) විභාගයට පළමුවර පෙනී සිටි ශිෂ්‍යයකු වීම.

අයදුම්කිරීමේ ක්‍රමවේදය

1. මූලික සුදුසුකම් සහිත පාසලේ විනය සම්බන්ධ දඩුවමකට ලක් නොවූ, අධ්‍යාපන, විෂය සමගාමී ,විෂය බාහිර හා ක්‍රීඩා සඳහා ඉහළ දක්ෂතා සහිත සිසුන් අදාල අයදුම්පත්‍රය මගින් 2026.11.17 දිනට ප්‍රථම ඉල්ලුම් කල යුතුය.

2. තමාට ලකුණු ලබාගත හැකි සියලු ලේඛනයන්හි තමා විසින් සහතික කළ ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවධර්න) ට භාර දී රිසිට් පතක් ලබා ගත යුතුය.

3. තමා විසින් ඉදිරිපත් කරන සියලු ලේඛනයන් සඳහන් කර දිවුරුම් ප්‍රකාශයක්, අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

තෝරා ගැනීමේ ක්‍රමවේදය

1. විදුහල්පති/පාසල් කළමනාකරණ කමිටුව විසින් නම් කරන තේරීම් කමිටුවක් මගින් සම්මුඛ පරීක්ෂණය පවත්වා තේරීම සිදුකරනු ලැබේ.

2. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලුම්කරු ඉදිරිපත් කර ඇති සහතික වල මුල් පිටපත් පරීක්ෂා කර අදාළ නිණ්ඨායක අනුව ලකුණු ලබාදී, ඉහළම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයා වසරේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස නම් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. කෙසේ වෙතත් ලකුණු ලබාදීම පිළිබඳව ඉල්ලුම්කරු සෑහීමකට පත් නොවන්නේ නම් ඔහු එම අවස්ථාවේම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සමග සාකාච්ඡා කර අවසන් තීරණයට එළඹිය යුතුය.

4. මෙහිදී ඉල්ලුම්කරු අභිමුඛව සාකච්ඡා කර ලකුණු පිරිනැමීම සිදුකරන බැවින් අභියාචනා හෝ නැවත සලකා බැලීමක් සිදුකරනු නොලැබේ.

5. තේරීම් කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

6. වසරේ දක්ෂතම ශිෂ්‍යයාගේ නම ප්‍රසිද්ධියට පත් කරන්නේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ අදාල අවස්ථාවේදීය.

පොදු කරුණු

1. අධ්‍යාපන ජයග්‍රහණ සඳහා ලකුණු පිරිනැමීමේදී,

- ජාතික මට්ටමේ විභාග (5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව, අ.පො.ස.(සා.පෙළ) ,අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සඳහා ලකුණු පිරිනැමේ.
- 2025 වෂර්යේ අ.පො.ස. (උ.පෙළ)විභාගයේ දිවයිනේ කුසලතාවය 1 සිට 20 දක්වා ලකුණු පිරිනැමේ.

2. විෂය සමගාමී/ විෂය බාහිර/ක්‍රීඩා අංශය සඳහා ලකුණු පිරිනැමීමේදී,

- අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ ජාත්‍යන්තර තරග ජයග්‍රහණ
- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන තරගාවලි, පාසල් සංගම් මගින් සංවිධානය කරනු ලබන සමස්ත ලංකා මට්ටමේ තරගාවලි , ජාතික සංගම් මගින් සංවිධානය කරන තරගාවලි පමණක් සලකා බලනු ලැබේ.
- 2021 සිට 2025 දක්වා වසර 5 තුල පාසල නියෝජනය කරමින් ලබාගත් ජයග්‍රහන පමණක් සලකා බලනු ලැබේ.
- ජාතික/ පළාත් මට්ටමේ ජයග්‍රහන සඳහා පළමු ,දෙවන හා තෙවන ස්ථාන පමණක් සලකා බලනු ලැබේ.
- කලාප මට්ටමේ ජයග්‍රහන සඳහා පළමු ස්ථානය පමණක් සලකා බලනු ලැබේ.
- ජාත්‍යන්තර තරගවලට සහභාගී වීමේදී අදාළ සිසුවාට අධ්‍යාපන අමාත්‍යාංශය සහ පාසල් සංගමය/ ජාතික සංගමය නියොජනය තහවුරු කළ යුතු අතර අවශ්‍ය වුවහොත් අදාළ ජාතික තේරීම් කමිටු නිදෙර්ශිත ලිපිය ඉදිරිපත් කල යුතුය.
- ලකුණු ලබාදීමේදී එකම වසරකදී එකම ඉසව්වක් සඳහා ලබාදී ඇති ඉහලම දක්ෂතාවය පමණක් සලකා බලනු ලැබේ.
- අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර සැළකිල්ලට ගනු නොලැබේ.